www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

### දෙවන ලෝක සංග්‍රාමය පිලිබඳ විශිෂ්ට සෝවියට් චිත්‍රපටියක්

# තවත් නම් යුද්ධ එපා! “කොක්කු ඉගිලෙති (195 7)” චිත්‍රපටියේ යුද විරෝධී පනිවිඩය

No more war! The anti-war message of *The Cranes Are Flying* (1957)

**ඩොරොටා නිම්ට්ස් විසිනි**
**2014 ජුනි 19**

මිනිස් ඉතිහාසයේ වඩාත් ම ලේ වැකි යුද්ධය වන දෙවන ලෝක මහා සංග්‍රාමය අවසන්වී 70 වසරකට පසු ලෝකය යලිත් වරක් මහා පරිමාන හමුදා ගැටුමක අනතුරට මුහුන දෙමින් සිටී.

තමා ද, සිය පූර්වගාමීන් ද “සාමය සහ සංහිඳියාවේ අභිවෘද්ධිය වෙනුවෙන් දශක හයක් පුරා දායකත්වය ලබාදී ඇතැයි” යන පදනම මත යුරෝපා සංගමය 2012 නොබෙල් සාම ත්‍යාගය නිර්ලජ්ජිතව භාර ගත්තේය. මෙය ඇති තතු ඔලුවෙන් හිටවීමකි.

ඉරාකයේ හා ඇෆ්ගනිස්ථානයේ ද ඇතුලුව ලොව පුරා ආන්ඩු පෙරලා දැමීම් හා අපරාධකාරී යුද්ධ ගනනාවකට ආධාර දීමේ 62 වසරක ඉතිහාසයක් යුරෝපා සංගමය සතුය. මෑතක දී එය, ලේ වැකි සිවිල් යුද්ධයක් ඇතිවන පරිදි හා තවත් න්‍යෂ්ටික බලවතෙකු වන රුසියාව සමග ගැටුමක තර්ජනය ඉස්මතු වන පරිදි, යුක්‍රේනය තුල අන්ත දක්ෂිනාංශික හමුදා කුමන්ත්‍රනයක් කරලියට නැංවීමට සිය එක්සත් ජනපද අනුචරයා සමග හවුලේ ක්‍රියා කලේය.

අඳුරු හාස්‍යයක් දනවන මෙම “සාම ත්‍යාගය” හා මහ බලවතුන්ගේ කුහකත්වයට කොහෙත්ම පාහේ අභියෝගයක් එල්ල නොකල ගානය. යුද්ධය සඳහා වූ තල්ලුවට එරෙහිව එකදු හඬක් හෝ ප්‍රමුඛ පෙලේ මාධ්‍ය තුලින් නැගුනේ නැත. එපරිද්දෙන් ම, අධිරාජ්‍යවාදී යුදවාදයට එරෙහිව විරෝධය දැක්වෙන එකදු චිත්‍රපටයක් හෝ මෑතක දී තැනුනේ නැත. බැරෑරුම් චිත්‍රපට රසිකයෙකුට හැඟෙන්නේ, තවදුරටත් අපේ ජීවිතවල වත්මන් යථාර්ථය යම් වැදගත් ආකාරයකින් නියෝජනය නොකරන චිත්‍රපට කර්මාන්තයේ මෙන් ම සමස්තයක් ලෙස සංස්කෘතියේමත් පවත්නා අතිමහත් රික්තයකි.

“යුද්ධය එපා”, යැයි කීමට අලුත් චිත්‍රපට නොපවතින තතු යටතේ, කවදා හෝ නිර්මානය කෙරුනු යුද විරෝධී චිත්‍රපට අතරින් විශිෂ්ටතම එකක් ලෙස තමාට හැඟී යන, සෝවියට් සංගමයේ නිපදවුනු “කොක්කු ඉගිලෙති (1957)” යන චිත්‍රපටය වෙත යලි පිවිසීමට මෙම විචාරිකාවට සිත් විය. 1958 කෑන්ස් චිත්‍රපට උලෙලේ දී පිරිනැමෙන ඉහලම සම්මානය වන පාම් ඩෝ සම්මානයෙන් පිදුම් ලද මෙම චිත්‍රපටය එම සම්මානය දිනා ගත් එකම සෝවියට් චිත්‍රපටය වෙයි. 1960 මාර්තුවේ ප්‍රදර්ශනය සඳහා මුදා හැරුනු කල්හි එය එක්සත් ජනපදය ද ඇතුලුව බටහිර රටවල පුලුල් ප්‍රේක්ෂක අවධානයකට පාත්‍ර විය.

“කොක්කු ඉගිලෙති” හි එන්නේ, ආදරයෙන් බැඳී විවාහාපේක්ෂාවෙන් පසුවන යෞවනයෞවනියන් දෙදෙනෙකු, එනම්, බෝරිස් (ඇලෙක්සේ බටලොව්) හා වෙරෝනිකා (තත්‍යානා සමොයිලෝවා) පිලිබඳ කථා පුවතයි. 1941 දී ජර්මානු හමුදා සෝවියට් දේශය ආක්‍රමනය කල කල්හි ඔවුන්ගේ විවාහ සැලසුම් කල් දමන්නට සිදු වෙයි. ශිෂ්ට සම්පන්න හා ආත්මාර්ථකාමී නොවන තරුනයකු වන බෝරිස් සෝවියට් හමුදාවට බැඳී යුද්ධයට පිටත් ව යයි. පසුව ඔහු යුද්ධයේ දී අතුරුදන් වී ඇතැයි වාර්තා වේ. බෝම්බ හෙලීමක දී සිය දෙමව්පියන් ද අහිමි වන වෙරෝනිකාට කිසිවිටෙක සිය පෙම්වතා අමතක නොවන නමුත්, වංචනික ලෙස හමුදාවට බඳවා ගනු ලැබීමෙන් වැලකී, බෝරිස් ඈ අසල නොමැති මුලු කාලය පුරා ඇය පසුපස එන බෝරිස්ගේ ඥාති සොහොයුරු මාක් සමග විවාහ වීමට ඇයට සිදුවෙයි.

වික්ටර් රොසොව්ගේ “සදාකාලිකව ජීවමානය” යන නාට්‍යය මත පදනම් වූ “කොක්කු ඉගිලෙති”, යුද්ධය සහ එය පිරිවරා සිටින අසංඛ්‍ය වූ දුක් වේදනාවන් හා චිත්ත පීඩාවන් විසින් සිය ජීවිතයට ඇති අයිතියට කුරිරු බාධා පමුනුවන ලද්දා වූ මනුෂ්‍යයන් පිලිබඳ සංකීර්න හා සත්‍යවාදී කථා ප්‍රවෘත්තියකි.

1953 දී සිදු වූ ස්ටැලින්ගේ මරනය නොවන්නට “කොක්කු ඉගිලෙති” නිර්මානය නොවන්නට බොහෝ විට ඉඩ තිබුනි. ජෝර්ජියාවේ ටිබලිසිහි උපත ලද සෝවියට් චිත්‍රපට අධ්‍යක්ෂක මිඛායෙල් කලටොසොව් (1903 - 1973) ඔහුගේ වඩාත් ප්‍රසිද්ධියට පත් චිත්‍රපටය වන මෙය නිර්මානය කලේ 1958 වසරේ, සෝවියට් සංගමයේ ඉතිහාසය තුල “ත්සෝ කාල පරිච්ඡේදය”

සර්ජ් අයිසන්ස්ටයින්ගේ සම්ප්‍රදාය අනුව යමින් බෝරිස් ජීවිතය හා ප්‍රීතිය කරා වෙරෝනිකා පසුපස දිව යන තරප්පු පෙල පසු අවස්ථාවක දී බෝම්බ ප්‍රහාරවලින් විනාශ වී ඇති අයුරු විලක්ෂනය කොට දැක්වේ. සිය දෙමාපියන් ශේෂයක් නොතබාම අතුරුදහන් වී ඇති බවට වන සිත් කම්පා කරවන සුලූ අනාවරනය කරා වෙරෝනිකාට මග පෙන්වනු ලබන්නේ එම බිඳුනු තරප්පු පෙල විසිනි. ගුවන් ප්‍රහාරයෙන් පසු ඔවුන්ගේ නිවසේ ඉතිරිව ඇති එකම දෙය වන්නේ, සැර ටික්ටික් හඬක් නංවන බිත්ති ඔරලෝසුව පමනි. තමාට වන අතිමහත් විපත නොතකා ජීවිතය තවදුරටත් දිගහැරෙන බව එය අතිශය වේදනාකාරී ලෙස ඇයට සිහිපත් කර දෙයි.

කලටෝසොව්ගේ චිත්‍රපටය අපේක්ෂාව ද ගැබ් කොට ගත්තකි. ත්‍රිකෝනාකාර "වී" හැඩයකට මොස්කව් නගරයට ඉහලින් පියාසර කරන කොකුන් රංචුවකින් නව ජීවිතයක් යලි උපත ලැබීම පිලිබඳ අපේක්ෂාව සංකේතවත් කෙරෙයි.

අධිරාජ්‍යවාදී යුද්ධ දෙකක කටුක පාඩම් අමතක නොකල යුතුය. එමෙන්ම, දෙවන ලෝක යුද්ධයත්, ඉන් සිදු වූ අතිමහත් මිනිස් ජීවිත විනාශයත් දායාද කොට දුන් ස්ටැලින්වාදයේ පාවාදීම්වල පාඩම් ද අමතක නොකල යුතුය.

යුක්‍රේනයේ වත්මන් අර්බුදය වූ කලී සෝවියට් සංගමයේ ඇදවැටීමට පාර කැපූ එම ස්ටැලින්වාදී පිලිවෙත්වලම ප්‍රතිවිපාකයයි.

වඩ වඩාත් වේගවත් වෙමින් පවත්නා යුදවාදයට හා නව ලෝක යුද්ධයක් කරා වන තල්ලූවට එරෙහිව සටන් වැදීමේ හදිසි අවශ්‍යතාවයක් පවතී. එය කල හැක්කේ ලාභය මත පදනම් වූ කුරිරු සමාජ ක්‍රමය අහෝසි කිරීම මගිනි. මක්නිසාදයත්, "යුද්ධය යනු නොකල හැක්කක් බවට පත්වනු ඇත්තේ, අප හුදු එක් රටක පමනක් නොව, මුලූ ලෝකයේ ම ධනපති පන්තීන් පෙරලා දමා, අවසාන වශයෙන් ඔවුන් අභිභවනය කොට, ඔවුන්ගේ දේපල පැහැර ගත් කල පමනක්" වන නිසාය.

ඉහත වචන, කොක්කු ඉගිලෙති චිත්‍රපටයේ බෝරිස්ගේ ලියන මේසය මත සාඩම්බරව වැජඹෙන කුඩා ප්‍රතිමූර්තියෙන් දැක්වෙන ව්ලැඩිමීර් ඉලීච් ලෙනින්ගේය.

මෙම චිත්‍රපටය හා එහි යුද විරෝධී පනිවුඩය එය මුලින් ම මුදා හල අවස්ථාවේ තරමටම බලගතු ලෙස හා අර්ථවත් ලෙස අද්‍යතන ප්‍රේක්ෂකයාට ද දැනී යනු ඇතැයි විචාරිකාව අපේක්ෂා කරයි. කොක්කු ඉගිලෙතිහි දැක්වෙන යුද්ධයේ අතිබිහිසුනු දසුන් යලි කවර හෝ දිනක දකින්නට නොසිදුවේවා යයි අපි ප්‍රාර්ථනා කරමු. චිත්‍රපටයේ අවසාන දර්ශනයේදී බෝරිස්ගේ මිතුරු ස්ටෙෆාන් දුම්රිය ස්ථානයේ ජනයා අමතා කරන කථාව උපුටා දක්වමින් අපි මෙම ලිපිය සමාප්ත කරමු:

"කාලය ගත වනු ඇත.
නගර ගම් යලි ඉදිවනු ඇත.
අපේ තුවාල සුව වී යනු ඇත.
එහෙත් යුද්ධය කෙරේ අපේ ඇති සැඩ ද්වේශය කිසිදා හීන වනු නැත.
අද සිය දයාබරයන් මුන ගැසීමට අසමත් සියල්ලන්ගේ ශෝකයට අපිදු කොටස්කරුවෝ වෙමු.
ස්නේහවන්තයන් යලි කිසි දිනෙකත් යුද්ධයෙන් වෙන් කරනු නොලැබීම, මවුවරුන් සිය දරුවන්ගේ ජීවිත පිලිබඳව යලි කිසිදා බියෙන් පසු නොවීම, යලි කිසිවිටෙකත් පියවරුන්ට කඳුලූ සඟවා ගැනීමට හා ඉකිය සිරකර ගැනීමට නොසිදුවීම සහතික කරනු වස් කල යුතු සියල්ල අපි කරන්නෙමු.
අපි ජය ලැබීමු. අප ජීවත්වන්නේ කිසිවිටෙකත් විනාශ කිරීම සඳහා නොව, නව ජීවිතයක් ගොඩනැගීම සඳහා ය."

තව දුරටත්, මෙම විචාරය, 80 විය සපුරා 2014 මැයි 5 දින අභාවප්‍රාප්ත වූ විශිෂ්ට රුසියානු නිලි තත්‍යානා සමොයිලොවාට ගෞරව පිනිස පුදකරමු.

මෙම චිත්‍රපටය 11881 ඇමසන් වෙතින් හා ක්‍රයිටීරියන් කලෙක්ෂන් වෙතින් ලබා ගත හැකිය.

© www.wsws.org